# ඩී. එස්. චින්තනය තුළින් බිහි වූ සමාජ නවෝදය

*එස්. එම්. කේ. බී. නන්දරත්න*
*පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී*
*ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය*

අනුරාධපුර යුගයේ සශ්‍රීකව කෙත් යායක්ව පැවති දිගාමඩුලු ප්‍රදේශය පොළොන්නරු යුගයෙන් පසුව අත්හැර දැමූ තත්ත්වයට පත්විය. ජාතියට ජීවය ලබා දීමට, ජනතාවගේ කුසගින්න නිවා දැමීමට සමත් වූ දිගාමඩුල්ලට නැවතත් යටවී ගිය ශ්‍රී විභූතිය ලබා දීමට ඉදිරිපත් වූ අය අතර මහාමාත්‍ය ඩී. එස්. සේනානායක අග්‍රාමාත්‍ය තුමාගේ නාමය නිතැතින්ම මතකයට නැග එන්නේ ය. එතුමා විසින් හතලිහේ දශකයේ අවසාන භාගයේ ආරම්භ කළ ගල්ඔය ජනපද යෝජනා ක්‍රමය මෙරට වාරි කර්මාන්ත ඉතිහාසයේ නවෝදයක් ඇති කළේය. ජාතික සම්පත් කළමණාකරණය කළ යුත්තේ කෙසේද යි මනාව ඔප්පු කරන හොඳම සාධක වලින් එකක් ගල්ඔය යෝජනා ක්‍රමය යැයි කිවහොත් එය සත්‍යයට නිහාවක් නොවනු ඇත. මෙම යෝජනා ක්‍රමය නිසා ඇති වූ මානව සම්පත් සංවර්ධනයට හා ජාතික සම්පත් සංවර්ධනයට විශේෂ තැනක් හිමි වන්නේ එය දේශීය මූල්‍ය සම්පත් පමණක්ම ප්‍රයෝජනයට ගෙන ඉදි කළ නිසයි.

ගල්ඔය යෝජනා ක්‍රමය ආරම්භ කිරීමේ දී ඉදිරියෙන් තබා ගත් පරමාර්ථ කීපයක් මෙහි සඳහන් කිරීම වැදගත් වේ යයි සිතේ. ඒවා නම්,

1. ගංවතුර පාලනය කිරීම
2. අමතර ඉඩම් අස්වැද්දීමට ජලය සැපයීම
3. නෙත්' කලාපයේ ජනගහණ ව්‍යාප්තියට විසඳුමක් ලබාදීම
4. ජල විදුලිය නිපදවීම
5. බීමට ජලය සැපයීම
6. කෘෂි භෝග ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරීම

යෝජනා ක්‍රමය අංශ තුනක් යටතේ සංවර්ධනයට ලක් විය. එනම්, වම් ඉවුර (වී වගාව), දකුණු ඉවුර (උක් වගාව), හා ගංගා ප්‍රදේශය වී වගාවත් ආදී වශයෙන් ය. එක් එක් අංශයන් යටතේ වගා කරන ඉඩම් ප්‍රමාණය බෙදා වෙන් කළහොත් වැඩිම ඉඩම් ප්‍රමාණයක් වම් ඉවුර යටතේ තිබෙන බව පැහැදිලිය.

1. ගංගා අංශය අක්කර 33,000
2. දකුණු ඉවුර අක්කර 20,000
3. වම් ඉවුර අක්කර 67,000

පට්ටිපොල ඔය යෝජනා ක්‍රමය යටතේ සංවර්ධනයට හසු වූ ගංගා අංශය සේනානායක සමුද්‍රය පිහිටුවීමටත් පෙර සිට අස්වද්දා තිබුණි. වේලි මාර්ගයෙන් ජලය ලබා ගෙන කුඹුරු ගොවිතැනේ නියැලි සිටි ගොවියෝ සේනානායක සමුද්‍රය යටතේ වඩාත් සාර්ථක අස්වැන්නක් නෙළීමට සමත් වූහ. යල මහ දෙකේදීම ස්ථිර ජල පහසුකම් ලබා ගැනීමට හැකියාව ඇති වූයෙන් නව ඉඩම් අස්වැද්දීමට හැකි සෑම අවස්ථාවකම ගොවියෝ ප්‍රයත්න දැරුවෝය.

දකුණු ඉවුර යටතේ අස්වැද්දන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 10,000ක් පමණ වූ අතර, ඉතිරිය (අක්. 10,000) උක් වගාව සඳහා යොදා ගන්නා ලදී. උක් වගාවට යෝග්‍ය පස් හා අවශ්‍ය තරම් ජල පහසුකම් දියුණු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් හිඟුරාන සීනි කර්මාන්ත ශාලාව පිහිටුවීමට ද අවස්ථාවක් උදා විය. මෙම සීනි කර්මාන්ත ශාලාව පිහිටුවීම නිසා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නව නැඹියාවක් එදා ඇති විය. එහෙත් කර්මාන්ත ශාලාවට අවශ්‍ය තරම් අමුද්‍රව්‍ය සැපයීමට නොහැකි වීමෙන් වසර මුළුල්ලේම එම කර්මාන්ත ශාලාව ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එපමණක් නොව වතුර නිකුත් කිරීමේ දී හැම විටම දකුණු ඉවුරට ප්‍රමුඛතාවයක් දුන් නිසා වම් ඉවුරේ ගොවීන්ගේ ජල ප්‍රශ්නය තවත් උග්‍ර විය.

වම් ඉවුර යටතේ පෝෂිත ප්‍රදේශය වශයෙන් අක්කර 45,000ක් මුලික සැලසුම්වල පෙන්වා දී ඇතත් මෙම අක්කර ප්‍රමාණයට වඩා අධික ඉඩම් ප්‍රමාණයක් අස්වද්දා තිබෙන බව අප අයාතනය 1981 සිට 1986 දක්වා කාලය තුළ කරන ලද සමීක්ෂණ වලින් හෙළිදරව් කර තිබේ. මේ බැව් තහවුරු කළ හැකි සාධක තුනක් පෙන්වා දිය හැක. එනම්,

(අ) රක්ෂිත වන ප්‍රදේශය ක්‍රමයෙන් පහළ බැසීම

(ආ) කුඹුරු ප්‍රදේශවල රක්ෂිත ඉඩම් හිඟවීම

(ඉ) දෙවැනි පරම්පරාවට අයත් නව කුඹුරු ඉඩම් ලියා පදිංචි කිරීම.

සේනානායක සමුද්‍රය යටතේ ආරම්භ වූ ගල්ඔය යෝජනා ක්‍රමය නිසා අද 60,000කට ආසන්න පවුල් සංඛ්‍යාවක් අම්පාර හා මඩකලපු දිස්ත්‍රික්ක යටතේ ජීවනෝපාය සළසා ගනිති. මේ පමණක් නොව, ගල්ඔය යෝජනා ක්‍රමය මුලින් සඳහන් කළ පරමාර්ථ මුදුන් පමුණුවා ගනිමින් නැගෙනහිර පළාතට කිසිදා අමතක කළ නොහැකි සේවාවන් රාශියක් ඉෂ්ට කර තිබේ. එම සේවාවන් අතර කිහිපයක් නම් කළහොත් මෙසේය.

1. කාලයක් වල්බිහි වී තිබුණු ප්‍රදේශයක් සරුසාර කෙත් යායක් බවට පත්කිරීම.
2. ජාති අතර සමගිය ගොඩ නැගෙන අයුරු සිංහළ, දෙමළ හා මුස්ලිම් යන ජාති තුනේම ගොවියෝ ජනපදලාභීන් වශයෙන් පදිංචි කිරීම.
3. දේශපාලන, සාමාජික, හා ආර්ථික ක්‍රියාවලියේ හිතකර බලපෑම නිසා අම්පාර වෙනම දිස්ත්‍රික්කයක් වශයෙන් නම් කිරීම.
4. ගොවි ජනපද වලින් සමාජයට, ප්‍රදේශයට හා ජාතියට සේවය කළ හැකි නව පරපුරේ නායකයන් බිහිවීම.

මහාමාත්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා 1951 ජනපදවලට නව ජානපදිකයන් යැවීම ඇරඹූ අවස්ථාවේ එහි පදිංචියට යාමට බොහෝ දෙනෙක් අකමැති වූහ. එයට ප්‍රධානම හේතුව තෙත් කලාපය අතහැර දමා ගොස් වියළි කලාපයේ මැසි මදුරු උවදුරු වලට ලක් වෙමින් කල් ගෙවීමට දක් වූ දැඩි අකමැතත්තයි. එහි යෑමට සිදු වීම දඬුවමක් වශයෙන් ද ඇතැම්හු සැළකූහ. විවිධ ප්‍රදේශ වලින් (මාතර, හම්බන්තොට, කළුතර, රත්නපුර, මහනුවර, වැලිමඩ, කෑගල්ල) විවිධ කුළ වලට අයත් පුද්ගලයින් ජනපදවල පදිංචි කරවීම නිසා ඒ තුළින් නව පන්නයේ සමාජ රටාවක් බිහි විය. ගොවිතැන නොදත් පිරිසක් ගොවීන් බවට පත්විය. කුල වශයෙන් බෙදී සිටි පිරිස් අන්තර් ක්‍රියාකාරිත්වය ඉතාමත් සතුටුදායක අන්දමින් සිදු වෙන්නට පටන් ගත්තේ ය. අවම පහසුකම් යටතේ ජීවත් වූ අසරණ පවුල්වලට නව නිවාස, නව පාරවල්, නව පාසැල්, විදුලිය, ප්‍රවාහන පහසුකම් ආදී සියල්ලක් ලබා ගැනීමට හැකි වූ අතර, ඔවුන් පෙරට වඩා බාහිර ලෝකය හා සම්බන්ධ විය. ඒ තුළින් සම්පත්වය තහවුරු විය. ඔවුන් තුළ ආත්ම විශ්වාසය තහවුරු විය.

මුලින්ම සඳහන් කළ පරිදි ගල්ඔය යෝජනා ක්‍රමය ආරම්භ කිරීම නිසා ජල සම්පත්, වන සම්පත්, ඉඩම් සම්පත් සංවර්ධනය වීම තුළින් ජාතික සම්පත්වල මහා ප්‍රගතියක් ඇති විය. අද කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඉතා වැදගත් තැනක් නැගෙනහිර පළාතට හිමි වෙනවා නම් ඒ ගල්ඔය යෝජනා ක්‍රමය නිසාම බව අමුතුවෙන් කිව යුතු නැත.

මානව සම්පත් සංවර්ධනය පිළිබඳව සලකා බලන විට 1951 සිට මේ දක්වා ඇති වී තිබෙන ප්‍රගතිය අති විශාල එකක් බව ඉතාමත් පැහැදිළිය. ගල්ඔය ජානපදිකයන්ගේ දූ දරුවෝ සමාජයේ විවිධ ඉහළ තරාතිරම්වල සිටිති. මේ අය අතර පරිපාලකයින්, දොස්තරවරුන්, ඉංජිනේරුවරු, කළමණාකරණ ක්ෂේත්‍රයේ නිළධාරීන්, ගුරුවරු, පර්යේෂකයෝ, දේශපාලනඥයෝ හා ඉහළ පෙළේ ව්‍යාපාරිකයෝ ද සිටිති. ගත වූ දශක හතර පිළිබඳව සැළකිල්ලට ගන්නා විට මේ තරම් ප්‍රගතියක් මෙරට වෙනත් පුරාණ ගමක සිදු වී තිබේදැයි සැකයක් පහළ වෙයි. පුරාණ ගම්වල එදා තිබුණු ප්‍රගතියවත් අද දක්නට නොමැති තරමට ඇතැම් පුරාණ ගම් පිරිහී තිබෙන්නේ ගම්මු අතර පවතින ආකල්ප හා මතිමතාන්තර නිසා ද, එසේත් නැතහොත් සංවර්ධන චක්‍රයට ඔවුන් හසු නොවීම නිසාද යන්න පැහැදිළි නැතත්, මේ කරුනු දෙකම එක සමානව බලපෑම නිසා විය හැකියි. පුරාණ ගම් හා ජනපද අතර සංසන්දනාත්මක විග්‍රහයක් කිරීම මගේ පරමාර්ථය නොවෙයි. මෙහිදී මාගේ අභිප්‍රාය වී තිබෙන්නේ ගල්ඔය ජනපදය බිහි කිරීම නිසා සිදුවූ සංවර්ධනය කවර අංශ ඔස්සේ විකාශනය වූවාද යන්න පෙන්නුම් කිරීම පමණි.

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සපයන ලද මුදල් ආධාර වලින් කළ එක් පර්යේෂණයක් අනුව පැහැදිළි වන ආකාරයට වම් ඉවුරේ ගොවි ජනතාව ජාතියට, දේශයට නායකත්වයක් දීමට හැකි වන අන්දමේ නායකත්ව කුශලතා අත්කරගෙන තිබේ. එම පර්යේෂණයෙන් හෙළි වූ තොරතුරු අනුව ගොවීන් විසින් අන්‍යොන්‍ය සුහදතාවය වර්ධනය කර ගනිමින් සිදුකළ ඵලදායී වැඩ පහත දක්වේ.

1. ශ්‍රමදාන පැවැත්වීම
2. ඇලවේලි පද්ධතිය නඩත්තු කිරීම හා ආරක්‍ෂා කිරීම.
3. පාරවල් අළුත්වැඩියාව කිරීම හා ඉදි කිරීම.
4. පන්සල් වැනි පොදු ස්ථාන ඉදි කිරීම.
5. සමුපකාර මගින් සාමාජිකයන්ට ණය ලබා දීම.
6. අරමුදල් ඇති කොට ගොවියා ණයගැති බවින් මුදා ගැනීම.
7. ගොවීන් අතර කාලයක් පැවති ජල ප්‍රශ්ණය විසඳ ගැනීම.
8. නව ඇල මාර්ග ඉදි කිරීම.
9. රජයේ නිළධාරීන් සමග සුහදව කටයුතු කිරීමට හැකි වීම.

ගල්ඔය ගොවීන් හා ඔවුන් විසින් පිහිටුවා ගත් සංවිධාන සමග කාලයක් සමීපව ආශ්‍රය කිරීම නිසා පැහැදිළි වූ එක් කරුණක් නම් පක්ෂ දේශපාලනය ගොවියාගේ ප්‍රගතියට ඉඳුරාම අහිතකර වී තිබීමයි. නායකත්වය එක් පුද්ගලයෙකුට සීමා කොට තබා ගන්නේ නැතිව අන්‍යයන් හටත් නායකත්ව කුශලතා වර්ධනය කර ගැනීමට අවස්ථාවක් සළසා දෙන්නේ නම් අභ්‍යන්තර මෙන්ම බාහිර ගැටළු මගහරවා

සංවිධාන සාර්ථකව පවත්වා ගෙන යා හැකි බැව් ගොවියෝ තරයේම විශ්වාස කරති.

අවසාන වශයෙන් ඉස්මතු කළ හැකි කරුණු කීපයක් සඳහන් කිරීම යෝග්‍ය වන්නේ ය. ගල්ඔය යෝජනා ක්‍රමය නිසා වසර මුළුල්ලේ නිහඬව ගලා ගොස් මහ සයුරට එක් වූ ජලකඳ ප්‍රයෝජනයට ගෙන නැගෙනහිර පළාතේ අක්කර සිය දහස් ගණන් අස්වැද්දීමෙන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නව පිටුවක්, නව දොරටුවක් විවෘත කළේය. රට සහළින් ස්වයංපෝෂණය කිරීමට පෙරට ආ වීර ගොවියෝ (සිංහල, දෙමළ, මුස්ලිම්) ජාතියේ ප්‍රාණ වායුව ආරක්ෂා කළා පමණක් නොව දේශයේ අනාගත වගකීම දැරීමට තරම් හැකියාව ඇති නව පරපුරක් බිහි කිරීමෙන් සිදු කළ සේවාව මානව සම්පත් සංවර්ධනය පිළිබඳව හොඳම නිදර්ශනයකි. මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මහතාගේ දූරදර්ශී ක්‍රියාකලාපය නිසා ජනගහණ ව්‍යාප්තිය පාලනය වූවා පමණක් නොව ජාතීන් අතර සමගිය ගොඩ නැගීමේ කර්තව්‍යය ද මේ ගල්ඔය යෝජනා ක්‍රමය නිසා සිදු වූ බව පෙන්වා දීම කාලෝචිත බැව් පෙනේ.